# තනතුරු ඇබෑර්තු

වෙළඳ, වාණිජ,ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය මඟින් තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයේ ගිණුම් සහකාර හා කළමනාකරණ සහකාර තනතුරු සඳහා අනුරාධපුර දිස්ත්‍රික් බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කාර්යාලයේ ගිණුම් සහකාර හා කළමනාකරණ සහකාර තනතුරු සඳහා මෙම නිවේදනයේ දැක්වෙන සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

i. අයදුම්කරු/ අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. සෑම අයදුම්කරුවෙකුම මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක අඛණ්ඩ ස්ථිර පදිංචියක් අනුරාධපුර දිස්ත්‍රික් බල ප්‍රදේශය තුළ තිබිය යුතුය.

( ඡන්ද හිමි නාම ලේඛනයෙන් ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු අතර කාලත්‍රයාගේ ස්ථිර පදිංචිය ගැන ද සළකා බලනු ලැබේ.)

iv. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයෙකු විය යුතුය.

**02. අධ්‍යාපන සුදුසුකම් :**

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර අයදුම්කරු පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ගිණුම් සහකාර**

i. ඉංග්‍රීසි ගණිතය මව්බස හා වාණිජ්‍ය යන විෂයන්ට සම්මාන සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එකවර විෂයන් 06කින් සමත්වීම.

හා

ii. පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාවක II මට්ටම සමත්වීම හෝ AAT II මට්ටම සමත් වීම.

**අමතර සුදුසුකම්**

- ප්‍රායෝගික පරිගණක හැකියාව හා පරිගණක පාඨමාලා හදාරා තිබීම අමතර සුදුසුකමක් වේ.
- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ව පැය 720 ක ට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.
- ආර්ථික මධ්‍යස්ථානයක තාවකාලිකව හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සළකා බලනු ලැබේ.

**කළමනාකරණ සහකාර**

i. අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් එකවර විෂයන් 03කින් සමත්වීම.
( පැරණි විෂය නිර්දේශයට අනුව අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් එකවර විෂයන් 03කින් සමත්වීම )

හෝ

ii. අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් ගණිතය ඉංග්‍රිසි මව්බස ඇතුළු විෂයන් 04කට සම්මාන සහිත ව විෂයන් 06කින් එකවර සමත්වීම සහ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක කළමනාකරණ සහකාර මට්ටමේ තනතුරක වසරක පළපුරුද්ද තිබීම.

**අමතර සුදුසුකම්**

- ප්‍රායෝගික පරිගණක හැකියාව හා පරිගණක පාඨමාලා හදාරා තිබීම අමතර සුදුසුකමක් වේ.
- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ව පැය 720 ක ට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.
- ආර්ථික මධ්‍යස්ථානයක තාවකාලිකව හෝ කොන්ත්‍රාත් පදනම මත සේවය කර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සළකා බලනු ලැබේ.

**03. බඳවා ගැනීමේ ක්‍රමය:**

i. සියලුම අයදුම්පත් කළමනාකරණ භාරය විසින් පත්කරනු ලබන ඇගයීම් මණ්ඩලයක් විසින් නිරීක්ෂණය කරනු ලබන අතර අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මණ්ඩලයේ අභිමතය මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

ii. තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් දෙදෙනෙකු ගිණුම් සහකාර හා කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

i. මෙම තනතුරු කොන්ත්‍රාත් පදනම මත වේ.

ii. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

iii. තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරයේ විශේෂ අවශ්‍යතාවය මත හා විෂයභාර අමාත්‍යංශයේ අවශ්‍යතාවය මත සේවා කාලය තීරණය කරනු ලැබේ.

iv. සේවා කාලය තුළ පැමිණීම ,හැසිරීම, වැඩ කොටස් ඉටු කිරිම, කාර්යක්ෂමතාවය ස්ථිර සේවයට බඳවා ගැනීමේදී සලකා බලනු ඇත.

v. කළමනාකරණ භාරය හා විෂය භාර අමාත්‍යංශය කඩින් කඩ නියම කරනු ලබන කොන්දේසිවලට යටත් විය යුතුය.

vi. තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාරය සේවායා වන බැවින් ස්ථාන මාරු ලබා ගත නොහැක.

vii. සාප්පු හා කාර්යාල සේවක පනත හා බඳවා ගැනීමේ සෙසු කොන්දේසි අදාළ වේ.

viii. සේවයට බඳවා ගැනීමේ හෝ නොගැනීමේ බලය කළමනාකරණ භාරය සතුය.

**05. වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය:**

**ගිණුම් සහකාර**

රු.27,910.00- 250 x10- 350 x10 -450 x 8 -රු.45,710.00

**කළමනාකරණ සහකාර**

රු.27,910.00- 250 x10- 350 x10 -450 x 8 - රු.45,710.00

**06. ඉල්ලුම් කළ යුතු පිළිවෙළ:**

සපයා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තමන් විසින් සකස් කරගත් නිවැරදි අයදුම්පතක් 2026.01.12 දින හෝ එදිනට පෙර ලේකම්, කළමනාකරණ භාරය, විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය තඹුත්තේගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ගිණුම් සහකාර", "කළමනාකරණ සහකාර "** යනුවෙන් තමා අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අයදුම්පත් භාර ගැනීම -** අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම අපැහැදිලි හෝ අවශ්‍ය අවශ්‍යතාවයන් සපුරා නොතිබීම, ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර නොවන වෙනත් ආකෘතියේ අයදුම්පත් ඉදිරිපත් කිරීම හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳව කෙරෙන කිසිඳු පැමිණිල්ලකට වග කියනු නොලැබේ.

**07. සාවද්‍ය තොරතුරු සැපයීම:**

මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. යම් හෙයකින් තෝරා පත්කර ගැනීමෙන් පසුව කිසියම් තොරතුරක් සාවද්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය සේවයෙන් පහ කරනු ලැබේ.

**08.** මෙම සම්මුඛ පරීක්ෂණය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය කළමනාකරණ භාරය සතු වේ.මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතියද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම හෝ පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතියද කළමනාකරණ භාරය සතු වේ.

**අණ පරිදි,**
**ලේකම්,**
**කළමනාකරණ භාරය ,**
**විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය,**
**තඹුත්තේගම.**
**2025.12.22**

- මේ පිළිබඳ වැඩි විස්තර පහත දුරකථන අංකයන්ගෙන් හා වෙබ් අඩවි මඟින් ලබා ගත හැක.
  - **තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
    වෙබ් අඩවිය :- http://thambuttegama.ds.gov.lk
    FB පිටුව :- Divisional Secretariat Thambuttegama
  - **තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය**
    දුරකථන අංකය:- 025 - 2275171
    වෙබ් අඩවිය :- Thambuttegama Dedicated Economic Center
    FB පිටුව :-Dedicated Economic Center - Thambuttegama